# දේශීය වෛද්‍ය පීඨය
# කොළඹ විශ්වවිද්‍යාලය
# ටෙන්ඩර් කැඳවීමයි

## දේශීය වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර සඳහා නිවාසයක්/ගොඩනැගිල්ලක් මාසික කුලී පදනම මත ලබා ගැනීම

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පිරිමි ශිෂ්‍යයන් අවම 40 දෙනෙකුට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයකට සුදුසු (වහාම පදිංචියට ගත හැකි) නිවාසයක්/ගොඩනැගිල්ලක් දේශීය වෛද්‍ය පීඨය පිහිටා ඇති රාජගිරිය හා තදාසන්න ප්‍රදේශයන්ගෙන් කොළඹ විශ්වවිද්‍යාලයට කුලී පදනම මත ලබා ගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

**2026.08.17** වන දින සිට **2026.09.10** වන දින පෙ. ව. **9.00** සිට ප.ව. **2.30** දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක **505170600013** වෙත රු. 1000/- ක (ආපසු නොගෙවනු ලබන) ගාස්තුවක් ගෙවීමෙන් ලබා ගන්නා ලදුපත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී , පීඨාධිපති කාර්යාලය , දේශීය වෛද්‍ය පීඨය, රාජගිරිය , කොළඹ විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් **2026.08.17** වන දින සිට **2026.09.10** වන දින **දක්වා වැඩ කරන දිනයන්හි පෙරවරු 9.00 සහ පස්වරු 2.30 අතර කාලය තුළදී ලංසු ලියවිලි ලබා ගත හැකිය. 2026.09.10 වන දින සවස 2.30 ට ලංසු භාර ගැනීම අවසන් වන අතර අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ . ඒ සඳහා ලංසු ඉදිරිපත් කල පුද්ගලයින් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය .**

ලංසු ලියවිල්ල මූලික පිටපත හා අනුපිටපත යනුවෙන් කොටස් දෙකකින් යුක්තය. මූලික පිටපත හා අනුපිටපත යන දෙකම ලංසුකරු විසින් පිරවිය යුතු අතර එසේ පුරවන ලද ලංසු පත්‍රිකා වෙන් වෙන් වශයෙන් කවර දෙකකට බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ **"දේශීය වෛද්‍ය පීඨයේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් සඳහා නිවසක්/ගොඩනැගිල්ලක් මාසික කුලී පදනම මත ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කර සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකාව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 යන ලිපිනයට **2026.09.10 වන දින ප. ව. 2.30** ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාල මන්දිරයේ සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. **2026.09.10** ප.ව. 2. 30 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
කොළඹ විශ්වවිද්‍යාලය
අංක 94 කුමාරතුංග මුනිදාස මාවත
කොළඹ 3